# දැයට කිරුළ වෙරළ වොලිබෝල් තරගාවලියේ මීගමුව කලාපයේ තරග නිමාවිය

■ සංජීව ධර්මසේන

කාණ්ඩ සියල්ලේම ශූරතාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ක්‍රීඩා සමාජය විසින් දිනාගනිමින් දැයට කිරුළ වෙරළ වොලිබෝල් තරගාවලියේ මීගමුව කලාපයේ තරග පසුගියදා මීගමුව වෙරළ තීරයේදී නිමාවට පත්විය.

විවෘත පිරිමි - ශූරතාව - ශ්‍රී ලංකා ගුවන් හමුදාව 'ඒ' ,අනුශූරතාව - ශ්‍රී ලංකා නාවික හමුදාව, තෙවැනි ස්ථානය - ශ්‍රී ලංකා ගුවන් හමුදාව 'බී', විවෘත කාන්තා, ශූරතාව - ශ්‍රී ලංකා ගුවන් හමුදාව 'ඒ', අනුශූරතාව - ශ්‍රී ලංකා වරාය අධිකාරිය, තෙවැනි ස්ථානය - ශ්‍රී ලංකා ගුවන් හමුදාව 'බී', ආධුනික පිරිමි, ශූරතාව - ශ්‍රී ලංකා ගුවන් හමුදාව, අනුශූරතාව - මීගමුව ක්‍රීඩා සමාජය 'ඒ', ආධුනික කාන්තා, ශූරතාව - ශ්‍රී ලංකා ගුවන් හමුදාව 'ඒ', අනුශූරතාව - ශ්‍රී ලංකා යූත්

# බාලක ශූරයා හෂාන්, බාලිකා ශූරිය ගයනි

කරන්දෙණිය එම්.එස් ප්‍රියන්ත

## ලාබාලම ක්‍රීඩකයා නිම්සර ක්‍රීඩිකාව නෙත්මුණි බාලක/බාලිකා ශූරතාව ධර්මාශෝක විද්‍යාලයට



අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලීය සැතපුම් දෙකේ විවෘත මුහුදු පිහිනුම් තරගාවලිය

හතළිස් වන අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයීය සැතපුම් දෙකේ විවෘත මුහුදු පිහිනුම් තරගාවලියේ විවෘත පිරිමි අංශයේ ශූරයා ලෙස සත්කාරක ධර්මාශෝක විද්‍යාලයේ හෂාන් මධුසංඛද - විවෘත කාන්තා ශූරිය ලෙස ධර්මාශෝක විද්‍යාලයේම ගයනි බිංදුහේවා ද සම්මාන දිනාගත්හ.

ධර්මාශෝක විද්‍යාලයට වසර සියයක් සපිරීමට සමගාමීව මෙවර තරගාවලිය විද්‍යාලයීය සියවස් කමිටුව, ක්‍රීඩා මණ්ඩලය හා ආදි ශිෂ්‍ය සංගමය එක්ව සංවිධානය කෙරිණි. විවෘත පිරිමි අංශයේ අනුශූරයාට හිමි සම්මානය අම්බලන්ගොඩ මාදම්පේ මහා විද්‍යාලයේ තරිඳු උදයංගට හිමිවූ අතර, එහි තෙවැනි ස්ථානයට හිමි සම්මානය මරදාන ජෝෂප් විද්‍යාලයේ බ්‍රෙන්ඩන් ප්‍රනාන්දු දිනා ගත්තේය.

විවෘත කාන්තා අංශයේ අනුශූරතාවට අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ඉමිෂා සෙව්වන්දි තේරී පත්වූ අතර, එහි තෙවැනි ස්ථානයට හිමි සම්මානය ශ්‍රී ලංකා යුද හමුදාවේ ආර්. ඩබ්.සී.සී ද සොයිසා දිනාගත්තේය. විනාඩි 75 ක කාලයක් තුළ තරගය නිමා කළ ළාබාලම ක්‍රීඩකයා ලෙස අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ පැතුම් නිම්සර ද ළාබාලම ක්‍රීඩිකාවට හිමි ස්ථානය අම්බලන්ගොඩ ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයේ නෙත්මුණි ද සිල්වා සම්මාන දිනාගත්තේය.

විනාඩි 75 ක කාලයක් තුළ තරගය නිමකළ වයස්ගතම ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා පොලිසියේ ධර්මසේන ද සිල්වා සම්මාන දිනා ගත්තේය. විනාඩි 75 ක කාලයක් තුළ තරගය නිමකළ ආබාධිත ක්‍රීඩිකාව ලෙස අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ඉමාෂා සෙව්වන්දි තේරී පත් වූ අතර, ආබාධිත ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා යුද හමුදාවේ ලාන්ස් කෝප්‍රල් ශාන්ත සිල්වා මහතා සම්මාන දිනා ගත්තේය.

තරගාවලියේ සමස්ත පිරිමි අංශයේ ප්‍රථම ස්ථානය ලකුණු 62 ක් ලබාගත් අම්බලන්ගොඩ මාදම්පගම මහා විද්‍යාලයට ද එහි දෙවනි ස්ථානය ලකුණු 58 ලබාගත් අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයටද එහි තෙවැනි ස්ථානය ලකුණු 47 ක් ලබාගත් මරදාන ශාන්ත ජෝශප් විද්‍යාලයටද හිමිවිය. සමස්ත කාන්තා අංශයේ ප්‍රථම ස්ථානය ලකුණු 62 ක් ලබාගත් ධර්මාශෝක විද්‍යාලයටද, ලකුණු 43 ක් ලබාගත් අම්බලන්ගොඩ ශ්‍රී දේවානන්ද විද්‍යාලයටද දෙවැනි තැනද, ලකුණු 24 ක් ලබාගත් ශ්‍රී ලංකා යුද හමුදාවට තෙවැනි තැනද හිමිවිය. අම්බලන්ගොඩ තානායම පිටුපස මුහුදු තීරයේ පැවති මේ පිහිනුම් තරගාවලියට උතුරු නැගෙනහිර ඇතුළුව පාසල් ජල ක්‍රීඩා සංගම්, පොලිසිය හා ත්‍රිවිධ හමුදාව ඇතුළුව පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ හයසියයක් පමණ සහභාගි වූහ. තරගාවලියේ ජය සංකේත ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආදි ශිෂ්‍ය හිටපු පිහිනුම් ශූරයෙකු වූ හිටපු ගුවන් හමුදාපති වර්තමාන පකිස්තාන ශ්‍රී ලංකා කොමසාරිස් ජයලත් වීරක්කොඩි මහතා සහභාගි වූ අතර විශේෂ ආරාධිත අමුත්තා ලෙස ආදි ශිෂ්‍ය පිහිනුම් ශූරයකු වූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ.පී.එන්. පද්මදේව මහතාද සහභාගි වූහ. ජය සංකේත ප්‍රදානෝත්සවයට වීරවිල ගුවන් හමුදා කඳවුරේ අණදෙන නිලධාරි ආදි ශිෂ්‍ය ඉන්දික වාසලගේ, ඩයලොග් සමාගමේ ප්‍රාදේශීය කළමනාකරු නිමල් ලියනගේ, ධර්මාශෝක විදුහලේ සහකාර විදුහල්පතිවරුන් වන ඩබ්.සරත්, විකුම් ප්‍රියලාල්, කේ.පී තිලකරත්න, සුනිල් පද්මසිරි, ක්‍රීඩා ලේකම් විරාජ් චමින්ද, තංගල්ල අධ්‍යාපන කලාප කාර්යාලයේ ක්‍රීඩා අධ්‍යක්ෂ ආර්.එම් ක්‍රිෂාන් දුමින්ද යන මහත්වරුද සහභාගි වූහ.



විවෘත පිරිමි අංශයේ ශූරයා



විවෘත කාන්තා අංශයේ ශූරිය



වයස්ගතම ක්‍රීඩකයා



ලාබාලම ක්‍රීඩකයා



ලාබාලම ක්‍රීඩිකාව

# හිල්ටන් රෙසිඩන්ස් වැසියන්ට ගුවන් හමුදාවෙන් පාඩමක්

සඳමාලි වික්‍රමආරච්චි

ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීමේ සහ ගලවාගැනීමේ ඒකකය පසුගියදා (08) හිල්ටන් රෙසිඩන්ස්හි ගිනි නිවීමේ ක්‍රියාකාරකමක් ඉදිරිපත් කළේය.

එමගින් හිල්ටන් රෙසිඩන්ස් ආශ්‍රිත හදිසි ගිනි ගැනීමකදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ ක්‍රියාකාරකමක් සහ දැනුවත් කිරීමක් එම නිවාස සංකීර්ණය ආශ්‍රිතව ජීවත්වන පුද්ගලයන්ට ලබාදෙන ලදී. ගුවන් හමුදා ගිනි නිවන ඒකකයේ අංශභාර නිලධාරී ෆ්ලයිට් ලෙෆ්ටිනන් ආර්.සී.එන්. රත්නෙත්තිගේ නායකත්වයෙන් ගිනි නිවන භටයන් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම ක්‍රියාකාරකම සිදුකෙරිණි.

මෙහිදී සේෆ්ටි රෝප් නම් කඹ ආධාරයෙන් සහ 'ස්කයි ලිෆ්ට් බ්‍රොන්ටෝ' නම් වාහනය උපයෝගී කරගනිමින් ඉහළ මහල්වල සිටින පුද්ගලයන් බේරාගැනීමට කටයුතු යොදනු ලැබීය.

# සිරිපාදේ වඳින්න ගිය තරුණයෝ 5 ක් මහවැලි ගඟට බිලි


මියගිය ගුවන් හමුදා සෙබළ චමින්ද බණ්ඩාර රත්නායක


කසුන් සඳරුවන් ගිය වර සිරිපාදේ යද්දී ගත් ජායාරූපය


ජනිත් මධුසංක නවරත්න


සුමිත් තෙන්නකෝන්


සමන් දිසානායක

■ ගම්පොළ සුරංග දිල්හාන්

ගම්පොළ වටදෙණිය ධර්මාපුර පදිංචි තරුණයන් පිරිසක් ශ්‍රී පාදය වන්දනා කිරීමට යන අතරතුර නාවලපිටිය වැලිගම්පොළ ප්‍රදේශයේදී මහවැලි ගඟේ දිය නෑමට ගොස් දියේ ගිලී මියගියහ.

මෙලෙස මියගොස් ඇත්තේ ගම්පොළ වැලිගල්ල ගම්වැල්ලාගොඩ පදිංචි ජනිත් මධුසංක නවරත්න (22), උඩුනුවර වටදෙනිය ධර්මාපුර පදිංචි සමන් දිසානායක (23), සුමිත් තෙන්නකෝන් (20), චමින්ද බණ්ඩාර රත්නායක (28) හා කසුන් සඳරුවන් කුලතුංග (26) යන තරුණයන් පස්දෙනෙකි.

මේ සම්බන්ධයෙන් පැවැත්වූ හදිසි මරණ පරීක්ෂණයේදී අදහස් දැක්වූ වැලිගම්පොළ පදිංචි දුලංග ලක්මාල් මහතා,

"ගමේ යාළුවොත් එක්ක අපි ගඟ පහළින් නානකොට අපට ටිකක් උඩින් හිටි කීපදෙනෙක් කෑ ගහනව ඇහුණා. කාට හරි අනතුරක් තමයි කියලා දැනගත්ත අපි ඉක්මනට එතැනට ගිහින් මොකද උණේ කියල ඇහුවා. ඒ අය කීවා තුන්දෙනෙක් ගඟේ ගිලුණා කියලා. අසංකයි, ජයසිංහයි, රුවනුයි ගඟට පැනල මේ අය හොයන කොට උඩ හිටිය අය කිව්වා අපේ හිටි පස් දෙනෙක්ම නෑ, ඒ අය ඔක්කොම යටවෙලා කියලා"

"අපි ගඟ පතුලෙ හොයනකොට මේ අය හමුවුණා. අපි කෑ ගහන සද්දෙට ගමේ අයත් ගඟ ළඟට ආවා. යටවෙලා හිටිය පස්දෙනා උඩට අරන් ගමේ අය එක්ක නාවලපිටිය රෝහලට ගෙනාවත් ඔවුන් සියලු දෙනාම මියගිහින් කියල දැනගත්තා" යනුවෙන් පැවසීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

"අපි මේ ප්‍රදේශයේ පදිංචි අය නිසා මහවැලි ගඟේ දිය නාන තැන් හා දිය නාන්න නුසුදුසු තැන් දන්නවා. මේ පිරිස ගිලී ගිය තැන අපි කිසිම කෙනෙකු දිය නාන්නෙ නෑ. එක්කො වැලිගම්පොළ වැල් පාලම ළඟ නානවා, නැත්නම් අපි කලින් නාපු තැන නානවා. නුසුදුසු තැනක නාන්න ගිය නිසා මේ අයට මේ අනතුර වෙන්න ඇති"

පස්බාගේ කෝරලේ හදිසි මරණ පරීක්ෂක මල්ලිකා හේවාවිතාරණ මෙනවිය මෙම මරණ පරීක්ෂණ පැවැත්වූවාය.

මේ ගමනට සහභාගී වූ වටදෙනිය ධර්මාපුර පදිංචි චන්න ජයලත් පතිරණ මහතා සාක්ෂි දෙමින් මෙසේ පැවසීය.

"අපි ගිය වෑන් රථයේ රියදුරු සමග දොළොස් දෙනෙක් හිටියා. අනෙක් වෑන් රථයේ දහ දෙනෙක් හිටියා. අපි දෙගොල්ලොම නාවලපිටියේදී හමුවෙලා මුලින්ම හරංගල පාරේ මල්ලන්ද පාලම ළඟට ගියා. දිය නාන්න සූදානම් වුණත් එතැන අනතුරු සහිතයි කියලා කට්ටිය කිව්ව නිසා අපි එතැනින් පිටත් වුණා. නාවලපිටිය නගරයේදී අනෙක් වෑන් රථය මඟහැර අපට ඉදිරියෙන් ගිනිගත්හේන පැත්තට ගියා. අපි මගින් හැරිලා වැලිගම්පොළ මහවැලි ගඟට ගියා"



**"පිරිස ගිලීගිය තැන කිසිකෙනෙක් දිය නාන්නෙ නෑ"**

"මුලින්ම අපි වැලිගම්පොළ වැල් පාලම ළඟ දිය නෑවා. රියදුරු ලෙස හිටිය ජනිත් දිය නෑවෙ නෑ. එයා ගොඩ හිටියා. අපිත් එක්ක දිය නාපු දෙන්නෙක් ගඟ පහළට ගියා. ඒ දෙන්නා ගඟට පැන්නම ගිලෙන්න පටන් ගත්තා. එතකොට අපේ තව දෙන්නෙක් ඒ දෙන්නව බේරගන්න ගඟට පැන්නා. එතකොට මේ හතර දෙනාම ගිලෙන්න පටන් ගත්තා. දිය නාන්න සූදානමක් නැතුව හිටිය ජනිත් මේ අය ගොඩගන්න ගඟට පැන්නෙ එවිටයි. අන්තිමේදී පස්දෙනාම දියේ ගිලිලා නොපෙනී ගියා. අපි කෑ ගහන කොට පහළින් දිය නාන්න ආව ගමේ තරුණයෝ පිරිසක් ඇවිත් මේ අය සොයලා උඩට ගත්තා."

මියගිය ජනිත් මධුසංක නවරත්නගේ පියා වන ගම්පොළ වැලිගල්ල පදිංචි නවරත්න බණ්ඩාර මහතා,

"මට පුතාල තුන්දෙනෙක් ඉන්නවා. මියගිය ජනිත් පවුලෙ බාලයා. මෙයා රස්සාවක් නොකළ නිසා මම එයාට අලුත් වෑන් එකක් අරන් දුන්නා. එයා ඒකෙන් හයර් යන්න පටන් ගත්තා. මේ ගමනත් එහෙම ගිය එකක්. අපට එදා හවස ආරංචි වුණා පුතාට කරදරයක් වුණා කියලා. පුතා බොන්නෙ නෑ. ගඟේ ගිලුණු අය බේරගන්න ගිහින් මේ අනතුර සිදුවුණා කියල දැනගත්තා. මේ මරණය ගැන අපට සැකයක් නෑ" යනුවෙන් පැවසීය.







**By Camelia Nathaniel**

# Conquering another frontier

## SLAF constructs Iranamadu Runway, entirely on its own, using its own resources

The Sri Lanka Air Force (SLAF), for the first time in its history, has constructed a 550-metre-long airstrip – a runway – entirely by them, at the Air Force station in Iranamadu.

The runway, which was earlier under the control of the LTTE, was initially built to accommodate light aircraft where a layer of tar was laid over gravel. However, when the LTTE abandoned the runway during their defeat, they had completely destroyed it by digging huge pits using heavy machinery.

However, the Air Force began rebuilding the runway on 22 June 2009, with a small crew comprising just 20 Air Force personnel, headed by the then Squadron Leader, H.M.C. Rupasinghe. Under the leadership of Sq. Ld. Rupasinghe, several of the most essential buildings were constructed in order to accommodate the Air Force personnel attached to the Iranamadu Unit.

The SLAF flag was raised for the first time at the Iranamadu Air Force Unit on 14 August 2009. On 3 August 2011, the unit was commissioned as the SLAF Camp, Iranamadu, under the command of its first Commanding Officer, Wing Commander, H.M.C. Rupasinghe.

The construction work of the new runway commenced on 12 August 2011, under the leadership of the current Commanding Officer of the Iranamadu Air Force Station, Wing Commander M.M.T.C. Manamperi.

However, the most important phase of the construction commenced only in February 2012.

### First time for SLAF

Prior to the construction of the Iranamadu Runway, the SLAF had never constructed a runway entirely on its own. Explaining further, Commanding Officer of the Rapid Runway Repair Wing of the SLAF, Wing Commander Sumedha de Silva, said the runway was constructed in order to accommodate the landing of even the largest of SLAF aircraft, the C130.

"This runway, which has been extended to 1,500 metres in length, is around 25 metres wide, including the two shoulders. At present, we have completed 1,100 metres of the runway and expect to complete the total length within the next two weeks. Almost 85% of the construction work is completed. My team has been working tirelessly round the clock for the past 10 months," he said.

Elaborating on the measures taken by his team to utilize the resources available from the surrounding areas, in order to minimize the cost, Wing Commander de Silva said the entire requirement of earth needed for the runway, which was around 42,000 cubes, was obtained from the surrounding areas, without any cost. "We used our own vehicles to transport the earth as well and also obtained the stones needed for the runway from our own crusher in Vavuniya," he said.

Currently, there are around 200 Air Force personnel engaged in this project, while according to Wing Commander de Silva, many of the personnel are being trained on the job. "The experience they receive while being engaged on this project will certainly be a great advantage for them when constructing roads and other such projects. For instance, all the machinery utilized for the construction of this runway has been acquired newly by the Air Force, but we have trained our own personnel to operate all the machinery. We have trained the masons and carpenters, within the Air Force, to operate the machinery and are utilizing their services. The training they receive will no doubt be an asset to them even if they leave the Air Force some day," he added.

### Commendable achievement

"Completing 85% of the work on the runway, within a span of just 11 months, is a commendable achievement for our team as we are not a qualified team to construct a runway. It is a specialized subject. We are working almost round the clock to complete the construction by March. We would have completed the construction by this time, if the rains had not hampered our work. During the past few months, this area was severely affected by bad weather and several areas were also affected by floods. This was the reason that we had to stall construction intermittently," he said.

Commanding Officer of the Iranamadu Air Force Station, Wing Commander Manamperi said designing, planning and construction of the runway was executed exclusively by Air Force engineers and other officials.

He also said once commissioned, the airstrip will not only be used by Air Force aircraft, but will also accommodate domestic aircraft, depending on the requirement. "The runway consists of four layers, in order to withstand the pressure of even C130. Usually a two-layer runway is sufficient for light aircraft landing," he said.

Commenting on the access routes to the Iranamadu Air Force Station, Wing Commander Manamperi said, Mankulam, Olumadu and the Ampakamam route, which is around 18 km, or Killinochchi, Wattakachchi and Ramanathapuram, Kalmadu routes can be used as an access route as it is only 16 km to the runway.

The first test-landing on the runway was successfully carried out by the Commander of the Air Force, Air Marshal Harsha Abeywickrema, on 9 December 2012. He piloted a Y12 aircraft himself and was extremely pleased with the condition of the runway.





*(Pix by Tharaka Basnayaka)*

# Charles Robinson seven-a-side hockey

The Colombo Branch of the Matale Old Thomians Association conducted the15th Charles Robinson Memorial Alll Island Invitational Hockey Tournament at Police Park.

Air Force emerged champions for the sixth time.



In the final, Air Force beat Police 1-0. After the game had ended in a 0-0 draw, centre forward L.G. Weerasuriya fired the 'Golden Goal' to give his team a 1-0 win. The winners received the Charles Robinson Memorial Trophy, a replica, Rs. 20,000/- and replicas for each member. In the photo Chief Guest Hayes Jayawardena presents the Champions Trophy to the skipper of the Air Force team D.T. Panditharatne. Also in the picture are R. Jayaweera, President of the Matale Old Boys Association (Colombo Branch) and M. Ratnaharan, Chairman of the Tournament Committee.



Dampiya Wanasinghe, Principal of St. Thomas' presents the runner-up trophy to the captain of the Police team, K.M.M. Wijeratne. The team also received a replica, Rs. 15,000-, while the players also received individual replicas.



Guest of Honour, M. Haniffa a distinguished old boy of STC presents the 2nd runner-up Challenge Trophy to the skipper of the Navy team, M.A.D.N. Mallawaarachchi. In the play off for the third place, Navy beat Wennappuwa 1-0. The Navy received a Challenge Trophy, a replica, Rs. 10,000/- while the members of the team were also in line for replicas. (BM)

# NEW PROCEDURE FOR STATE LAND DISTRIBUTION

The Northern Province Governor, Major General G.A. Chandrasiri, has instructed the District Secretaries and government officials to adhere to a new system when using and allocating State lands in the North.

In a circular the Governor had said:

"When renting, leasing, or developing all State Lands in the five districts of Jaffna, Kilinochchi, Mullaitivu, Mannar and Vavuniya or taking back any State Land, special permission must be obtained from the Governor. "This decision was taken on the advice of the President and only in accordance with this new procedure all State Lands in the North would be dealt with immediate effect. This applies to all State institutions including the Army, Navy, Air force and the Police. "All applications for such land should first obtain the Governor's approval through their respective Grama Sevakhas and District Secretaries. "All District Secretaries have been informed of this new procedure to be strictly complied with and they would also be briefed at a meeting to be held in the Governor's office tomorrow February 6."

> **"When renting, leasing, or developing all State Lands in the five districts of Jaffna, Kilinochchi, Mullaitivu, Mannar and Vavuniya or taking back any State Land, special permission must be obtained from the Governor"**

**LAND ALLOCATION**

# Jayalalithaa blames PM for US going soft on Lanka

Tamil Nadu Chief Minister J. Jayalalithaa yesterday blamed Indian Prime Minister Manmohan Singh for the watered down US resolution at the UN Human Rights Council (UNHRC) against Sri Lanka last year.

Replying to a debate in the assembly, she said: "Last year, the US brought a strong resolution against Sri Lanka. The Indian government voted in favour of the resolution at my continued insistence."

In support of her charge, Jayalalithaa said Manmohan Singh wrote to Sri Lankan President Mahinda Rajapaksa later: "You would be aware that we spared no effort and were successful in introducing an element of balance in the language of the resolution."She

**RESOLUTION**

> **"Last year, the US brought a strong resolution against Sri Lanka. The Indian government voted in favour of the resolution at my continued insistence"**

said that while the Sri Lankan government did not take any action even on the watered down resolution, information had reached her that the US was bringing another resolution against the island nation this year.

In the interests of Sri Lankan Tamils, the Indian government, based on the resolution passed by state assembly, should table a resolution on Sri Lanka at the UN and get it passed, Jayalalithaa added.

Blasting the "careless attitude" of the Indian government vis-a-vis Indian fishermen, who she said were continuously attacked by the Sri Lankan Navy, she urged the central government to take up the issue with Colombo as a matter of urgency. **(IANS)**

**JAYALALITHAA AND SRI LANKA**

- Mar 07, 2012: **Tamil Nadu chief minister Jayalalithaa termed India's support to Sri Lanka at the UNHRC untenable and demanded support for the US resolution on accountability issues of the Sri Lankan civil war.**
- Mar 23, 2012: Chief Minister Jayalalithaa expressed happiness over India voting in favour of US-backed resolution against Sri Lanka at the UNHRC, describing it as `heartening`, but said India had been `very indecisive on this very sensitive issue`.
- July 05, 2012: **Chief Minister Jayalalithaa has objected to the training given to Sri Lankan Air Force personnel in Chennai and asked the central government to cancel the training send them back to Sri Lanka.**



© DM GraphicsDesk



# Fire evacuation drill at Central Bank

The Sri Lanka Air Force firefighters in collaboration with the Colombo Fire Unit carried out a Fire Evacuation drill at the Central Bank yesterday.

The SLAF firemen demonstrated several rescue operations such as aerial rope and high angle rescue using the Bronto sky-lifter. They also demonstrated the operation and use of 'Jumping Sheet' which was placed on the ground.

Thirty five SLAF personnel participated in the Fire Evacuation Drill including the Chief Fire Officer, Group Captain P.M. Dias and Officer-in-Charge of the firefighters, Flight Lieutenant R. Ranneththi.

> "The SLAF firemen demonstrated several rescue operations such as aerial rope and high angle rescue using the Bronto sky-lifter"

# CISM Run



The CISM Day run, which involved a four kilometre walk, was seen passing the Lighthouse Junction yesterday (17). Nearly 300 members of the forces, including the three service chiefs, participated in it. Pic by Kushan Pathiraja

MENACE

# Cannabis cultivated on large scale at national parks

By Sarasi Paranamanna

Cannabis cultivations in national parks have become one of the major threats to the wildlife in national parks.

The Department of Wildlife Conservation said, growing cannabis inside national parks is not only illegal but is a major threat to the availability of roaming space and food sources of the animals.

"Out of 8 raids done in the Udawalawe National Park since the beginning of 2013, 6 were involving cannabis cultivation sites inside national parks. Usually the Department of Wildlife Conservation (DWC) carries out about 1000 raids per year and in Udawalawe park alone 16 raids involving cannabis cultivation were done" said DWC spokesperson, Hasini Sarathchandra.

> **The cannabis cultivation specially affects the elephant population inside national parks which faces the danger of running out of food sources because of these activities**

She said, the cannabis cultivation specially affects the elephant population inside national parks which faces the danger of running out of food sources because of these activities.

"Due to this the human elephant conflict also aggravates when the elephants wander into bordering villages near national parks in search of food. Our department's wildlife officers are vigilant and carry out raids constantly to curb the cannabis menace" she said.

The Sri Lanka Air Force is also involved in mapping out cannabis cultivations inside national parks.



# DENGUE ON THE RISE IN COLOMBO

By Yohan Perera

The number of reported dengue cases in the Colombo City had increased up to 214 during this month so far, Colombo Municipal Council (CMC) said yesterday.

CMC Chief Medical Officer Dr. Pradeep Kariyawasam said new cases are reported from Kirulapone, Wellawatte, Kollupitiya, Thimbirigasyaya and Dematagoda almost daily.

He said Dematagoda is the most vulnerable area in the city at the moment.

Dr. Kariyawasam said 60 per cent of the reported cases in the city are under the age of 20 while around 25 percent of the cases are under the age of five.

The Chief Medical Officer suggested early preparedness to control the disease. "We usually start house visits by May and the residents start cleaning their premises only after we start carrying out these visits. But I would suggest that the residents clean up their gardens and premises early as possible," he said.

Dr. Kariyawasam said the CMC is also waiting for the aerial spraying of BTI bacteria in Colombo as per the recent announcement made by the Health Ministry.



The Ministry recently announced that spraying of BTI bacteria will take place in Colombo by March 15.

It was announced that this decision was made by Health Minister Maithripala Sirisena who has had special discussions in connection with importing of BTI bacteria.

Cuban BTI bacteria will be sprayed from the air in Colombo using Air Force helicopters. Dengue in Colombo spread rapidly due to the large number of high rise buildings with concrete slabs, half built buildings with concrete slabs on the top of them. Gutters are the other main problem it was said.

## DENGU SITUATION




Source: Epidemiology unit

© DM GraphicsDesk



NEW CASES FROM **KIRULAPONE, WELLAWATTE, KOLLUPITIYA, THIMBIRIGASYAYA** AND **DEMATAGODA** ALMOST DAILY

# Dhammika betters her three national records

S M JIFFREY ABDEEN,
Kandy Sports Corr


Dhammika Harischandra

Dhammika Harischandra of Sri Lanka Air Force turned out to be the Queen of lifters when she smashed three existing weightlifting national records for women at the annual Senior Women's Weightlifting National organized by the Sri Lanka Weightlifting Federation and worked off at Royal College, Polonnaruwa this week.

Competing in 76 kilogramme body weight category the heavily built Dhammika Harischandra snatched 76 kilogrammes and later clean and jerked 91 kilogrammes to Aggregate 167. All three marks were National Records.

The previous records of snatch 73 kilogramme and clean and jerk 90 kilogrammes and total 163 registered at the Defence Services Weightlifting Championship last year too were held by her.

Dhammika Harischandra hails from Menikhinna and trains at Kandy YMCA under the guidance of former national weightlifting coaches Athula Wijewickrama and S A Wijewickrama and represented the Kandy YMCA before joining the Sri Lanka Air Force which helped her to enhance her weightlifting career.

# සිව්වන තෙල් ළිඳේ කැණීම් කටයුතු අද ඇරැඹේ

කේත් ලංකා ආයතනය මන්නාරම ද්‍රෝණියේ සිදුකරනු ලබන දෙවැනි අදියරේ සිවු වැනි තෙල් ළිඳේ කැණීම් කටයුතු අද (01) ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව කේත් ඉන්දියා හ කේත් ලංකා හි සංනිවේදන ප්‍රධානී ආචාර්ය සුනිල් භාරතී මහතා ප්‍රකාශ කළේය.

ඔහු සඳහන් කළේ කල්පිටිය වෙරළේ සිට කිලෝමීටර් 22ක් ඈතින් මෙම කැණීම් කටයුතු සිදුකරනු ලබන අතර, මුහුදු මට්ටමේ සිට කිලෝමීටර 11ක් හා එතැන් සිට මුහුදු පතුලේ සිට කිලෝමීටර 3ක් ගැඹුරට මේ කැණීම් කටයුතු සිදුකරන බවයි.

සිංගප්පූරුවේ 'ට්‍රාන්ස් ඕෂන්' සමාගමට අයත් නෞකාවකින් මෙම කැණීම් සිදුකරනු ලබන අතර රාත්‍රී කාලයේ දී මෙම කැණීම් සිදුවන අතර එම සීමාවට පවතින ආලෝකය හේතුවෙන් කැණීම් සිදුකරන නෞකාව ප්‍රදේශවාසීන්ට දර්ශනය කිරීමට අවස්ථාව තිබේ.

එමෙන්ම කැණීම් කටයුතුවලදී ස්වභාවික ගෑස් සොයා ගැනීමට විශාල ඉඩකඩක් ඇති බව භාරතී මහතා සඳහන් කරන අතර තෙල් සඳහාත් අඛණ්ඩව ගවේෂණ සිදුකරන බවද ඔහු පැවසුවේය.

හතර වැනි ගවේෂණ ළිඳේ කැණීම් කටයුතුවලදී ස්වභාවික තෙල් ඇති බව තහවුරු




කේත් ශ්‍රී ලංකා සමාගම මගින් සිදු කරන මන්නාරම් ද්‍රෝනියේ තෙල් කැණීම් කටයුතු සම්බන්ධ සාකච්ඡා වැඩමුළුවක් ඉකුත් ද කොළඹ කිංග්ස්බරි හෝටලයේදී පැවැත්විණි. මෙම වැඩමුළුව ඇරඹීමට පෙර ඛණිජතෙල් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් සාලිය වික්‍රමසූරිය මහතා පොල්තෙල් පහන දැල්වූ අයුරු. කේත් ශ්‍රී ලංකා සන්නිවේදන ප්‍රධානී ආචාර්ය සුනිල් භාරතී මහතා ඇතුළු මේ අවස්ථාවට සහාගි වූ පිරිස ද මෙහි වෙති.

වුවහොත් ඇගයුම් මට්ටමේ කැණීම් සඳහා කේන් සමාගම අවතීර්ණ වන බවත්, එසේ සිදුකරන ඇගයුම් සාර්ථක වූවොත් වාණිජමය වශයෙන් කැණීම් වසර 3ත් 5ත් අතර කාලයකින් පටන් ගන්නා බවත් ආචාර්ය සුනිල් භාරතී මහතා සඳහන් කරයි.

මේ සම්පූර්ණ කැණීම් කටයුතු සඳහා කේන් ඉන්දියා සමාගම විසින් දැනටමත් ආයෝජනය කර ඇති මුදල්වල වටිනාකම ඩොලර් මිලියන 150කි.

කේන් ආයතනය මේ කැණීම් කටයුතු මේ වසර මැද දී සිදුකිරීමට මෙයට පෙර සැලසුම් කර තිබුණද විදුම් යන්ත්‍රණය නියමිත කාලයට කලින් ලබා ගැනීමට හැකිවූ නිසා සහ සැලසුම් වල කාර්යක්ෂමතාව නිසා නියමිත කාලයට වඩා කාර්තුවක් කලින් මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට හැකිවී තිබේ. "ට්‍රාන්ස් ඕෂන්" සමාගම විසින් කැණීම් කටයුතු සඳහා යාන්ත්‍රික පහසුකම් ලබාදීම හේතුවෙන් දෙවන අදියරේ කැණීම් කටයුතු සඳහා වන පූර්ව සූදානම් කටයුතු දැනටමත් සම්පූර්ණ කොට ඇත.

"ට්‍රාන්ස් ඕෂන්" සමාගම විසින් සපයා ඇති මෙම නැවට අඩි 6500 ක් තරම් ගැඹුරකට පවා ගොස් කැණීම් කටයුතු සිදුකිරීමේ පහසුකම්වලින් සමන්විත වේ. මේ විදුම් යන්ත්‍රය මගින් මීට ඉහතදී ඉන්දියානු මහද්වීප සමුද්‍ර කලාපයේ හා නැගෙනහිර මුහුදේ කැණීම් කටයුතු සිදුකර ඇත. මේ අතිනවීන විදුම් යන්ත්‍රය 'ට්‍රාන්ස් ඕෂන්' ආයතනයේ නිෂ්පාදනයක් වන අතර, එය මෙහෙයවීම සඳහා සියයකට අධික කාර්ය මණ්ඩලයක් හා විශේෂඥ පුහුණුවක් ලත් පිරිස් යොදවා තිබේ.

කේන් ඉන්දියා සමාගම ලංකාවේ තෙල් ගවේෂණ කටයුතුවල පළමු අදියර 2011 දී දියත් කරන ලදී. එහිදී ළිං දෙකේ ස්වභාවික ගෑස් ඇති බව සොයා ගන්නා ලදී.

මේ නව සොයා ගැනීමත් සමගම ලංකාවේ වසර 30කට පසු පළමු වරට ගෑස් හා ඛනිජ තෙල් පද්ධතියක් ඇති බවට තහවුරු විය.

# කඳුකරයේ පළමු
# ගුවන්තොටුපළ නුවරඑළියට

සිරිමෙවන් කස්තුරිආරච්චි

ශ්‍රී ලංකාවේ කඳුකරයේ පිහිටුවන ප්‍රථම අභ්‍යන්තර ගුවන්තොටුපළ නුවරඑළියේ ඉදිකරන බව සිවිල් ගුවන් සේවා ඇමැති පියංකර ජයරත්න මහතා පැවැසීය.

නුවරඑළිය ගුවන් තොටුපළ සඳහා නුවරඑළිය කඳපොල ප්‍රදේශයේ පේද්‍රු වත්තේ ඉඩමක් තෝරාගෙන ඇති අතර, එහි දිගින් මීටර් 900 ක් සහ පළලින් මීටර් 40 ක් වන ගුවන් ධාවන පථයකින් සමන්විත අභ්‍යන්තර ගුවන් තොටුපළක් ඉදිකරන බවද හෙතෙම පැවැසීය.

ඕනෑම දේශගුණික තත්ත්වයකට සරිලන නවීන තාක්ෂණයෙන් සමන්විත අධිබල ආලෝක ධාරාවලින් යුතු ධාවන පථයක් සහ අති නවීන රේඩාර් උපකරණ සහ සෙසු උපාංග සහිත ගුවන් පාලක මධ්‍යස්ථානයක් ඇතුළු සියලු පහසුකම් සහිත අංගසම්පූර්ණ ගුවන් තොටුපළක් ඉදිකරන බවද ඇමැතිවරයා කීවේය.

# ගුවන් පාපැදි ශූරයන්ට තෑගි පිට තෑගි

සුසල් ප්‍රේමලාල්

ලබන මාර්තු 1 සිට 3 දක්වා කොළඹ කේන්ද්‍ර කොට ගෙන (ආරම්භය සහ අවසානය) පැවැත්වීමට නියමිත තුන්දින ගුවන් පාපැදි සවාරියට පාපැදි ධාවක ධාවිකාවන් සහභාගි කරවන්නැයි දකුණු ආසියාවේ අසල්වාසි රටවල් කිහිපයක ගුවන් හමුදා මූලස්ථානවලට දැනුම්දී ඇති බව ශ්‍රී ලංකා ගුවන් හමුදා පාපැදි සංගමයේ සභාපති සහ ශ්‍රී ලංකා පාපැදි අතුරු පාලන කමිටුවේ ප්‍රධානි එයාර් වයිස් මාර්ෂල් ගගන බුලත්සිංහල පවසයි.

මීට පෙර පැවැති ගුවන් පාපැදි සවාරියට විදෙස් රටවල් කිහිපයකින් ගුවන් හමුදා පාපැදි ධාවක ධාවිකාවන් සහභාගි වූ බව පවසන එයාර් වයිස් මාර්ෂල් බුලත්සිංහල මෙවර ද ඉන්දියාව, පාකිස්තානය සහ බංග්ලාදේශය වැනි රටවල ගුවන් හමුදා මූලස්ථාන ඊට යහපත් ප්‍රතිචාරයක් දක්වනු ඇතැයි අපේක්‍ෂා කරයි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 62 වැනි සංවත්සරයට සමගාමීව ගුවන් පාපැදි සවාරිය මෙහෙයවනු ලබන අතර අඛණ්ඩව සංවිධානය කරනු ලබන 14 වැනි වසර මෙය වෙයි.

2013 වසරේ ජාතික මට්ටමින් මෙහෙයවනු ලබන ප්‍රථම පාපැදි සවාරිය ද මෙය වෙයි. ශ්‍රී ලංකා පාපැදි අතුරු පාලන කමිටුව අදාළ පාපැදි සවාරියේ තාක්‍ෂණ කටයුතු මෙහෙයවනු ලබන අතර එල්. බී. අබාන්ස් ආයතනය නිල අනුග්‍රාහකත්වය දරනු ඇත.

රුපියල් මිලියන 1.2 (රුපියල් ලක්‍ෂ දොළහක්) ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට මුදලින් ත්‍යාග පිරිනමන ගුවන් පාපැදි සවාරිය පිරිමි හා කාන්තා දෙඅංශයෙන්ම සංවිධාන කොට ඇත.

අදියර 3 කින් ක්‍රියාත්මක කෙරෙන ගුවන් පාපැදි සවාරියේ පිරිමි අංශයේ තරගය දුර කිලෝ මීටර් 420 කින් සමන්විතය. කොළඹ ගුවන් හමුදා මූලස්ථානය අසලින් ලබන මාර්තු 01 දා පෙ.ව. 8.30 ට ආරම්භ කෙරෙන පිරිමි තරගයේ පළමු අදියර දඹුල්ල දක්වාද (කිලෝමීටර 147.1) දෙවැනි අදියර මාර්තු 2 දා දඹුල්ලේ සිට පුත්තලම දක්වාද (කිලෝ මීටර 142.9) තෙවැනි අදියර මාර්තු 3 දා, පුත්තලම සිට කොළඹ ගුවන් හමුදා මූලස්ථානය දක්වාද (කිලෝමීටර 128.6) ක්‍රියාත්මක වෙයි.




ගුවන් පාපැදි සවාරියට අදාළ අනුග්‍රාහක චෙක්පත එල්. ජී. අබාන්ස් ආයතනයේ අලෙවි අධ්‍යක්‍ෂ චන්න පතිරණ මහතා විසින් ශ්‍රී ලංකා ගුවන් පාපැදි සමාජයේ සභාපති එයාර් වයිස් මාර්ෂල් ගගන බුලත්සිංහල වෙත භාර දුන් අවස්ථාව.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වෙළෙඳ අධ්‍යක්‍ෂ අනිල් සිරිමල්වත්ත මහතා (දකුණේ) ඡායාරූපයේ සිටියි.

ඡායාරූපය - චන්ද්‍රසිරි වීරසිංහ

පාපැදි සම්මේලනයට අනුබද්ධ පාපැදි සමාජ සහ කණ්ඩායම්වලට අයත් ජ්‍යෙෂ්ඨ පිරිමි සහ වයස අවුරුදු 23 න් පහළ පාපැදි ධාවකයන්ට ගුවන් පපාදැ සවාරියේ පිරිමි අංශයට ද එවැනිම පාපැදි ධාවිකාවන්ට කාන්තා අංශයට ද සහභාගි විය හැක. කාන්තා සවාරිය එක් අදියරයකට පමණක් සීමා වන අතර එම තරගය ලබන මාර්තු 3 දා පෙ.ව. 8.30 ට කළුතර කටුකුරුන්දේ සිට කොළඹ ගුවන් හමුදා මූලස්ථානය දක්වා කිලෝ මීටර් 51.1 ක දුරකින් සමන්විතව පැවැත්වෙනු ඇත.

ගුවන් පාපැදි සවාරියට කාන්තා තරගයක් ඇතුළත් වන දෙවැනි අවස්ථාව මෙය වෙයි.

ගුවන් පාපැදි සවාරියේ (සමස්ත) ප්‍රථම ස්ථානයට රු. 3,00000 ක් ද, දෙවැනියාට රු. 2,00000 ක් ද, තුන්වැනියාට රු. 1,00000 ක් ද, සිවුවැනියාට රු. 50,000 ක් ද පස්වැනියාට, රු. 40,000 ක් ද, හයවැනියාට රු. 25,000 ක් ද, හත් වැනියාට රු. 20,000 ක් ද අටවැනියාට රු. 15,000 ක් ද නව වැනියා සහ දහවැනියාට රු. 10000 බැගින් ද එකොළොස්වැනියා සිට පහළොස්වැනියා දක්වා රු. 35,00 ක මුදලක් ද පිරිනැමීමට විධිවිධාන යොදා ඇති තරග සංවිධායකයන් අදියරේ ප්‍රථම ස්ථානයට රු. 15,000 ක් ද දෙවැනි ස්ථානයට රු. 10000 ක් ද තුන්වැනි ස්ථානයට රු. 5000 ක් ද පිරිනැමෙනු ඇත.

සෑම අදියරකම ස්ප්‍රින්ට් ශූරයාට රු. 5000 ක් ද, සමස්ත ස්ප්‍රින්ට් ශූරතාව සඳහා රු. 20,000 ක්ද ගුවන් පාපැදි සවාරියේ ලාබාලතම ධාවකයාට රු. 50000 ක් ද (තරගය නිම කරන) පිරිනැමෙනු ඇත.

මීට අමතරව ගුවන් පාපැදි සවාරියට (පිරිමි) සහභාගිවන සියලු තරගකරුවන්ට (තරගය නිම කරන) දිනකට රු. 2000 බැගින් පාරිතෝෂික දීමනාවක් ලබා දෙන අතර එය ආහාර සහ නවාතැන් පහසුකම්වලට අමතරව වීමද විශේෂත්වයකි. මෙය කණ්ඩායම් කළමනාකරුවන්ට ද වලංගු වෙයි. කාන්තා තරගයේ සහභාගිත්වයට දිනකට ගෙවන මුදල රු. 15,00 බැගිනි.

කාන්තා තරගය ප්‍රථම ස්ථානයට රු. 5,0000 ක් ද දෙවැනි ස්ථානයට රු. 30000 ක් ද තුන්වැනි ස්ථානයට රු. 20000 ක් ද, හතරවැනි ස්ථානයට රු. 15,000 ක් ද පස්වැනි ස්ථානයට රු. 10000 ක්ද පිරිනැමෙන අතර ස්ප්‍රින්ට් ජයග්‍රාහිකාවට රු. 10000 ක් ද ප්‍රදානය කෙරෙනු ඇත.

අර්බුදය

# නිශාන්ත සහ නිලූකා පාපැදි පුහුණු සංචිතයෙන් ඉවත් වෙති

